


# බිරිඳ සහ දියණිය ගැනම සිතන ගෝවින්දා

සිනමාවේ නළුවෙකු ලෙසින් පමණක් නොව සාමාන්‍ය ජීවිතයේදීත් පුතකු සහෝදරයකු ලෙස යුතුකම් ඉටුකරන නළුවකු ලෙස ගෝවින්දා ජනතාවගේ හද බැදගත් නළුවෙකි. දැන් මන්ත්‍රීවරයෙකි. ඔහු සැමියකු ලෙසත්, දියණියකගේ පියෙකු ලෙසත් තම වගකීම් හඳුනා ගෙන යුතුකම් ඉටු කරයි.

කාලයක් පවුල් ප්‍රශ්න නිසා අවුල් මනසකින් යුතුව කාලය ගතකළ ගෝවින්දා නැවතත් ඔහුගේ බිරිඳ සුනීතා සමග ආදරයෙන් කල් ගෙවන බව වාර්තා වේ.
අපේ පවුල දරුණු අනතුරකට භාජනය වුණා කියලා මම හිතනවා. එය මට මරණ බය ඇති වූ පළමු අවස්ථාව. 1990 දී මගේ රියදුරා සහ මා රැගත් මෝටර් රථය දරුණු අනතුරකට ලක්වුණා. මගේ වාහනය හඳුනාගත නොහැකි තරම් වුණා. ඒක වාහනයක්ද කියලා හිතා ගන්න බැරි තරම් විනාශ වුණත් අපි දෙන්න බේරුණා.
පොඩි අත්වැරදීමකින් ජීවිතය නැතිවෙන්න පුළුවන් කියන සත්‍ය එදා මම අවබෝධ කර ගත්තා.
අපි හැමෝටම ජීවිතයට ආදරය අවශ්‍යයි. මව්පියන්ගේ, සහෝදර සහෝදරියන්ගේ, බිරිඳගේ, සැමියාගේ සහ දරුවන්ගේ ප්‍රාර්ථනා සහ ආදරය යහපත් ජීවිතයකට මග පාදනවා.

ඔබ ආදරය කරන අයට කවුරු හරි ප්‍රශ්න ඇති කරනවාට ඔබ කැමතිද? ඔබ ආදරය කරන අය ඔබට හිරිහැර කරනවාට ඔබ කැමතිද? ඇත්තටම නැහැනේ. ඒ නිසාම ආදරයේ වටිනාකම මම අවබෝධ කරගෙනයි ඉන්නේ.



ඇත්තටම යුනීතා සහ මම හැමවෙලාවේම සතුටින්. ඇය බොම්බායේ මෝස්තර නිරූපිකාවක් ලෙස කටයුතු කළා. යුනීතා කියන්නේ මගේ පළමු ආදරය. ඒ ආදරයට මම හරිම ආදරෙයි. ඒ ආදරය නැතිකර ගන්නට මට බැහැ.

ඇය මට හමුවුණේ මීට වසර විස්සකට කලින්. දෙවියන් ජීවිතයට හොඳ දේ ලබාදෙනවා කියලා මම දන්නවා. මම මෙතනදී එකක් කියන්නම ඕනි. නළුවකුගේ බිරිඳක් ලෙස ජීවත්වීම හරිම අමාරු වැඩක් කියන එක. නළුවෙකුගේ බිරිඳක් හරිම කල්පනාකාරීව අවබෝධයෙන් කටයුතු කළ යුතුයි.

නළුවෙක් වුණාම ඕනෑම කෙනෙක් එක්ක කතා කළයුතු වෙනවා. අපිට රසිකාවියන් වැඩියි. ඒක ස්වභාවය. තේරුම් ගත යුත්තේත් ඒ ටිකම තමයි.
මගේ බිරිඳ ගැන මම කතා කරන්නේ ආඩම්බරයෙන්. මගේ අම්මා ජීවත් වෙලා හිටපු කාලේ ඇය මගේ අම්මාටත් හොඳට සැලකුවා. ඉතාම හොඳින් බලා ගත්තා. ඇය මගේ



අම්මාට කිසිම විටෙක ලේලියක් වුණේ නැහැ. දුවෙක් වුණා මිසක. ඒ වගේම මගේ අම්මාත් නැන්දම්මා කෙනෙක් නොවී අම්මා කෙනෙක් වීම මට සතුටක්.
කාලය සහ මිතුරන් වෙනස් වෙනවා. සැපේදී ඉන්න මිතුරන් දුකේදී නැහැ. ඒත් මගේ බිරිඳ මගේ දුව හැමදාම මගේ ළඟ සිටින අය. දුවගේ ගෞරවය රකින්න ඕනේ කොහොමද කියලා මම දන්නවා.

මිතුරියන් සිටියට මිත්‍රත්වයට වඩා යමක් එහි නැහැ. සොහොයුරියක් කියන හැඟීමෙන් කටයුතු කළොත් ඔය කිසි ප්‍රශ්නයක් මතුවෙන්නේ නැති බවයි ගෝවින්දා ලඟදීම සහභාගි වුණු පුවත්පත් සාකච්ඡාවේදී අනාවරණය කළේ.

කසුන් දුනුරංග

